# අ.පො.ස. උසස් පෙළ

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

# A/L - GIT



Presenter
Anoma Dolewatta (Zonal CRC – Mawanella)
Tel: 035 2246110
PGD (ICT) - University of Kelaniya,
B.Sc.with ICT- University of Kelaniya,
B.Ed.(N.I.E. – Maharagama)

GIT

# නිපුණතා මට්ටම 4.2

සරල ගණිත ගැටළු විසඳීම

සඳහා

පැතුරුම්පත් මෘදුකාංග

භාවිත කරයි.

## කොටස - 1

GIT

# පැතුරුම්පත් මෘදුකාංග

## කොටස - 1

**ඉගෙනුම් පල :**

- පැතුරුම්පත් මෘදුකාංග සංක්ෂිප්ත ව විස්තර කරයි
- බහුල ව දක්නට ලැබෙන පැතුරුම් පත් මෘදුකාංග ලැයිස්තු ගත කරයි
- පැතුරුම්පත් මෘදුකාංගවල කාර්යයන් ලැයිස්තු ගත කරයි
- පැතුරුම්පත් මෘදුකාංගවල චිත්‍රක අතුරු මුහුණතේ සංරචක හා ලක්ෂණ හඳුනාගනී
- අවශ්‍ය පරිදි, සක්‍රිය කොටුව (Active Cell) වැඩපතක එහා මෙහා ගෙනයයි
- කොටුවක ඇතුළත් කළ හැකි දත්ත ප්‍රරූප ලැයිස්තු ගත කරයි

GIT

# පැතුරුම්පත් මෘදුකාංග

ගණිතමය මෙහෙයුම් ඉටුකිරීම සඳහා යොදාගනු ලබන අන්තර් ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික පරිගණක යෙදුමක් **පැතුරුම්පතක්** ලෙස හැඳින්වේ.

එමෙන්ම එය සංඛ්‍යාත්මක දත්ත ගබඩා කිරීම, සංවිධානය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රස්ථාරික නිරූපණය සඳහා ද යොදාගත හැකිය.

GIT

# පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ

- Google Sheets – (Online and free)
- Apple Numbers – Apple iWork Suite
- LibreOffice – Calc (Free)
- Microsoft Excel – Microsoft Office suite
- OpenOffice – Calc (Free)

අතුරුමුහුණත


හා


එහි සංරචක

හඳුනා ගනිමු


**GUI of spreadsheet software**

**Graphical User Interface**




අතුරුමුහුණත
හා
එහි සංරචක
හඳුනා ගනිමු
1. ඉක්මන් ප්‍රවේශ මෙවලම් තීරුව
Quick Access Tool Bar
2. මාතෘකා තීරුව
Title Bar
3. රිබනය
Ribbon
4. උදව්ව
Help
5. පාලන බොත්තම්
Control buttons
6. ශ්‍රිත ආදානය
Insert Function
7. පටිති
Tabs
8. සූත්‍ර තීරුව
Formula Bar
9. තීරු ශීර්ෂක
Column Headings
10. නාම කොටුව
Name Box
11. සිරස් අනුචලන තීරුව
Vertical Scroll Bar
12. සක්‍රිය කෝෂය
Active Cell
13. පේළි ශීර්ෂක
Row Headings
14. වැඩපත් පටිති
Sheet Tab
15. තිරස් අනුචලන තීරුව
Horizontal Scroll Bar
16. පටිති පෙරළීමේ බොත්තම්
Worksheet navigation
17. තත්ත්ව තීරුව
Status Bar
18. දැකුම් බොත්තම්
View Buttons
19. සූමය පාලනය
Zoom Control


# වැඩ පොත




පැතුරුම්පත් ගොණුවක් වැඩ පොතක් ලෙස හැඳින්වේ

වැඩ පොතේ එක් පිටුවක් වැඩපතක් ලෙස හැදින්වේ

වැඩපත





Student Project Mark Sheet

| Student No | Student Group | Project Start Date | Number of week for project complete | Project Complete Date | Name | Word | Excel | Access | BONUS | TOTAL | AVERAGE | RANK | GRADE |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| COM002 | COMPUTER | 1/6/2012 | 2 | 1/20/2012 | Silva | 56 | 24 | 85 | 65.00 | 165 | 55.00 | 7 | Credit |
| MAN022 | MANAGEMENT | 5/3/2012 | 10 | 5/12/2012 | Samith | 25 | 85 | 25 | 60.00 | 135 | 45.00 | 12 | Pass |
| MAN025 | MANAGEMENT | 3/7/2012 | 12 | 3/30/2012 | Kamal | 75 | 95 | 41 | 85.33 | 211 | 70.33 | 5 | Merit |
| COM005 | COMPUTER | 4/9/2012 | 14 | 4/16/2012 | Aruna | 95 | 75 | 25 | 75.00 | 195 | 65.00 | 6 | Credit |
| MAN018 | MANAGEMENT | 5/7/2012 | 11 | 5/23/2012 | Nanda | 25 | 26 | 85 | 60.33 | 136 | 45.33 | 11 | Pass |
| COM007 | COMPUTER | 6/1/2012 | 10 | 6/10/2012 | Raja | 45 | 45 | 65 | 61.67 | 155 | 51.67 | 9 | Credit |
| MAN010 | MANAGEMENT | 1/1/2012 | 13 | 1/1/2012 | Manjula | 98 | 95 | 45 | 94.33 | 238 | 79.33 | 3 | Merit |
| COM009 | COMPUTER | 1/2/2012 | 14 | 1/9/2012 | Kumari | 54 | 28 | 62 | 58.00 | 144 | 48.00 | 10 | Pass |
| COM025 | COMPUTER | 2/2/2012 | 4 | 2/1/2012 | Silva | 62 | 45 | 58 | 65.00 | 165 | 55.00 | 7 | Credit |
| MAN008 | MANAGEMENT | 5/12/2012 | 12 | 5/4/2012 | Saman | 58 | 75 | 85 | 87.67 | 218 | 72.67 | 4 | Merit |
| COM012 | COMPUTER | 2/28/2012 | 5 | 2/3/2012 | Supipi | 99 | 96 | 89 | #### | 284 | 94.67 | 2 | Merit |
| MAN005 | MANAGEMENT | 2/29/2012 | 6 | 2/11/2012 | Dinithi | ### | 100 | 95 | 113.33 | 295 | 98.33 | 1 | Merit |
| Maximum | | | | | | 100 | 100 | 95 | | | | | |
| Minimum | | | | | | 25 | 24 | 25 | | | | | |
| Count | | | | | | 12 | 12 | 12 | | | | | |

| Number of days for week | 7 |
|---|---|
| Group Name | Bonus |
| COMPUTER | 10 |
| MANAGEME | 15 |

වැඩපතේ සිරස් අතට පිහිටි කොටු එකතුවක් තීරුවක් නම් වේ.

පළමු තීරුව ඉංග්‍රීසි හෝඩියේ මුල් අකුරින් ආරම්භ වී අවසානය තෙක් ඉදිරියට නම් කරයි. (උදා - A, B, C, ……..., AA ,AB , …. , AZ, BA, …, XFD)





වැඩපතේ තිරස් අතට පිහිටි කොටු එකතුවක් **පේළියක්** නම් වේ.


පළමු **පේළිය** 1න් ආරම්භ වී අවසානය තෙක් ව්‍යාප්තව පවතී.

(උදා - 1,2, .........65536, .......,1048576)

පළමු කොටුව A1 වන අතර එය ද අවසාන පේලියේ අවසාන තීරුවකි ව්‍යාප්තව පවතී.
(A1, A2, …,XFD1048576)



# එක වර තෝරා ඇති කොටු කිහිපයක් කෝෂ පරාසයක් ලෙස හැඳින්වේ.




මෙම කෝෂ පරාසයට B2, B3, B4, B5 යන කෝෂ 4 ඇතුළත් වේ. පරාසය B2 න් ආරම්භ කර B5න් අවසන් කර ඇත.

මෙම කෝෂ පරාසය B2:B5 මඟින් නිරූපණය වේ.

තීරුවක් ඔස්සේ ඇති කෝෂ පරාසයක තීරුවේ අක්ෂරය නියත ව පවතියි.

පැතුරුම්පතට දත්ත ඇතුළත් කිරීමට පෙර අදාළ කෝෂය සක්‍රිය කළ යුතු ය. ඉන් පසු දත්ත ඇතුළත් කළ යුතු ය. කෝෂයක අන්තර්ගතය වන්නේ ලේබල් (Label), අගයන් (Value) හෝ සූත්‍ර (Formula) යන ඒවායින් එකකි.

## 1.ලේබල

යතුරුලියනය කරන ලද අක්ෂර (Letters), සංඛ්‍යා (Numbers), විශේෂ සංකේත (Special Symbols) මගින් හෝ ඒවා සංයෝජනයෙන් හෝ ලබා ගන්නා පාඨ (Text) ලේබල ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් ලේබල කෝෂයක වම් එකෙල්ල වේ (Left Align).

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | නම | දිස්ත්‍රික්කය | පළාත | දුරකථන අංකය | ඊ-තැපැල |
| 2 | පියුමි කෞශල්‍යා | කෑගල්ල | සබරගමුව | 03512232438 | piumi@gmail.com |
| 3 | A.මල්ලිකාදේවි | මහනුවර | මධ්‍යම | 08350632867 | maldevi@yahoo.com |
| 4 | දිලීෂ ගම්හේවා | කොළඹ | බස්නාහිර | 01278643563 | dilesha@hotmal.com |
| 5 | හකීම් අන්වර් | මාතර | දකුණ | 01369589596 | anwerhac@live.com |
| 6 | | | | | |

## 2. අගයන්


සංඛ්‍යාත්මක වටිනාකමක් සහිත දත්ත අගයන් ලෙස සලකනු ලබයි. සාමාන්‍යයෙන් අගයන් කෝෂයක දකුණු එකෙල්ල වේ (Right Align). අගයන් ලෙස පවතින දත්ත ආකාර කීපයක්


| | A | B | C |
|---|---|---|---|
| 1 | පූර්ණ සංඛ්‍යා(Integer) | 23 | |
| 2 | දශම සංඛ්‍යා(Decimal) | 5.72 | |
| 3 | භාග සංඛ්‍යා(Fractional) | 3 1/4 | |
| 4 | ප්‍රතිශත සංඛ්‍යා(Percentage) | 65% | |
| 5 | විද්‍යාත්මක සංඛ්‍යා(Scientific) | 4.37E+04 | |
| 6 | දිනය(Date) | 07/05/12 | |
| 7 | වේලාව(Time) | 2.45 PM | |
| 8 | මුදල්(Currency) | Rs 400.00 | |
| 9 | | | |


## 3. සූත්‍ර

ගණනය කිරීම උදෙසා සමාන (=) ලකුණින් ආරම්භ කර අගයයන්, කෝෂ ලිපින සහ ශ්‍රිත යොදා ගනිමින් ලියනු ලබන ප්‍රකාශන සූත්‍ර ලෙස හැඳින්වෙයි. වැඩපතේ කෝෂයකට සූත්‍රයක් ඇතුළත් කළ විට එමගින් ගණනය වූ අගය කෝෂය තුළ දිස්වන අතර සූත්‍රය සූත්‍ර තීරුවේ දිස්වේ.

උදාහරණ 1 - A1 සහ B1 කෝෂවල අන්තර්ගතවල එකතුව C1 කෝෂය තුළට ලබා ගැනීම.




Best match
Excel
App
Apps
File Explorer
Internet Explorer
Samsung Printer Experience
Search the web
ex - See web results
Documents (4+)
Folders (1+)
Settings (2+)
Excel
App
Open
Recent
Unit_4_2
Book1 - in Ashoka
Book1 - in Downloads
Sabaragamuwa_Mawa
Sabaragamuwa
Semester III-Marine 2019-2020
Detail
Ex_1
CRC Application
ex


Excel
Good morning
Home
New
New
Open
A
B
C
1
2
3
4
5
6
7
Take a tour
Blank workbook
Welcome to Excel
Recent
Pinned
Name
Unit_4_2
D: » GIT_2021

# සාරාංශය

- ගණිතමය මෙහෙයුම් ඉටුකිරීම සඳහා යොදාගනු ලබන අන්තර් ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික පරිගණක යෙදුමක් **පැතුරුම්පතක්** ලෙස හැඳින්වේ.
- පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ:

Google Sheets – (Online and free), Apple Numbers – Apple iWork Suite, LibreOffice – Calc (Free),Microsoft Excel – Microsoft Office suite, OpenOffice – Calc (Free)

- අතුරුමුහුණත හා එහි සංරචක
- වැඩ පොත හා වැඩපත
- සක්‍රිය කෝෂය, කෝෂ ලිපින
- එක වර තෝරා ඇති කොටු කිහිපයක් **කෝෂ පරාසයක්** ලෙස හැඳින්වේ.
- කෝෂයක ඇතුලත් කළ හැකි **දත්ත ප්‍රරූප**

GIT

# Thank You

Zonal CRC – Mawanella